---

# මහර ප්‍රාදේශීය සභාව
# ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ර්යේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මහර ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) රු.31,221,758 ක ඉඩම් හුවමාරු මුද්දර ගාස්තු ලැබීම් මූලධන ආධාර ලැබීම් ලෙස ගිණුම්ගත කිරීම නිසා මුද්දර ගාස්තු ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූලධන ආධාර එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ආ) 2007 හා 2009 වර්ෂ සඳහා ලැබුණු උසාවි දඩ මුදල් රු.4,194,825 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි ආයුර්වේද ඖෂධ තොගයේ වටිනාකම රු.359,478 ක් තොග ශේෂයට ඇතුළත් කොට නොතිබුණි.

(ඈ) 2012 දෙසැම්බර් මස ප්‍රේෂණ මගින් බැංකුවට බැරවී ඇති රු.947,000 ක්වූ මන්ත්‍රී දීමනා සහ වැටුප් ප්‍රතිපූර්ණ රු.2,350,000 ක් ණයගැතියෝ ලෙස ගිණුමේ දක්වා තිබුණි.

(ඉ) ඌරුවල් පේරුව කාර්යාලයෙන් ලබාගත් තොරතුරු අනුව රු.1,789,183ක ඉඩම් හා ගොඩනැගිලි ඒකක 10 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත වී නොතිබුණි.

(ඊ) පරිත්‍යාග ලෙස ලැබුණු පර්චස් 20 ක ඉඩම් ඒකක 1 ක් හා පොදු පහසුකම් ලෙස ලැබුණු ඉඩම් ඒකක 07 ක් තක්සේරු කර ගිණුම් වල දක්වා නොතිබුණි.

(උ) නාරංවල හා මහර උප කාර්යාලවල ඉඩම් හා ගොඩනැගිලි ගිණුම සඳහා ලබා දුන් උපලේඛන අනුව ඉඩම් කැබලි 11 ක් සඳහා රු.20,346,925 ක් දෙවරක් සටහන් කර තිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.3,092,383 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 <u>නොසැසඳුනු පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 09 කට අදාළව ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.137,182,533 ක් වු අතර, ඒවාට අදාළ උපලේඛන/ වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව රු.93,221,510 ක් වූයෙන් රු.43,961,023 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 <u>පැහැදිලි නොකළ වෙනස්කම්</u>

ගිණුම අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පොදු ගබඩා අතැති තොගය රු.4,512,086 ක් වු අතර, එදිනට ගබඩා ලෙජරය අනුව අතැති තොග ශේෂය රු.3,864,914 ක් වූයෙන් රු.647,172 ක්වු වෙනසට හේතු අනාවරණය නොවීය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,164,216 ක්වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. රු.34,625,413 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත, ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට අදාළව සභාපතිවරයා විසින් ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදයම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 5,436 | 5,041 | 10,429 |
| (ii) | බදු කුලී | 1,911 | 1,485 | 1,947 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 550 | 550 | 153 |

2.2.2 <u>වරිපනම් හා බදු</u>

2012 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.10,016,836 ක්වු අතර, එම ශේෂය තුළ මහර උප කාර්යාලයට අයත් රු.10,000 ට වැඩි වරිපනම් බදු හිඟ ශේෂ රු.1,270,993 ක් වු අතර, ඒ තුළ වසර 20 කට වඩා පැරණි හිඟ ශේෂයන්ද ඇතුළත්ව තිබුණි. තවද, නාරංවල උප කාර්යාලයේ රු.5,000 ට වැඩි හිඟ වරිපනම් බදු ශේෂය රු.775,357 ක්ද විය. මෙම හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.2.3 <u>මුද්දර ගාස්තු</u>

බස්නාහිර පළාත් ආදායම් කොමසාරිස්ගේ හා 2011 ජනවාරි 13 දිනැති අංක බප/අදා/කො/පොදු (1) දරන චක්‍රලේඛය ප්‍රකාර මුද්දර ගාස්තු අයකරනු ලැබූ වර්ෂයේ දෙසැම්බර් 31 දින සිට වර්ෂ 03 ක් ඇතුළත මුද්දර ගාස්තු ඉල්ලුම් කළ යුතු වුවත්, මීගමුව හා කළුතර ඉඩම් රෙජිසට්‍රාර් කාර්යාල වලින් දීර්ඝ කාලයක සිට මුද්දර ගාස්තු රැස්කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2011 ජනවාරි සිට විගණිත දින වූ 2013 මැයි 09 දක්වාද රැස්කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 <u>උසාවි දඩ</u>

අත්තනගල්ල, ගම්පහ අධිකරණ කාර්යාලවලින් 2011 ජනවාරි සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා අයවිය යුතු උසාවි දඩ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) සභාවට පොදු පහසුකම් යටතේ පැවරී ඇති හා වෙනත් ආයතනවලින් ලැබී ඇති ඉඩම් සඳහා ප්‍රකාශන ඔප්පු හෝ ඔප්පු ලබා ගැනීමට කටයුතුකර නොමැති අවස්ථා 16 ක් අනාවරණය විය.

(ආ) නාරංවල උප කාර්යාලයට අයිති ප්‍රයිම්ලැන්ඩ් වෙන්දේසි ඉඩමේ සැලසුම් අංක 4641 යටතේ වු අක්කර 3 රූඩ් 01 පර්චස් 4.59 ක සැලසුමෙහි 10% ක පොදු කොටසක් වෙන්කර නොතිබියදීත් සභාව විසින් අනුබෙදීම් අනුමත කර තිබුණි.

---

2.4 <u>නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්</u>

සභාවට අයත් පොදු පහසුකම් ඉඩම් 12 ක් හා නාන ළිං 06 ක් කිසිදු කාර්යයක් සඳහා යොදා නොගෙන වල් බිහිවී තිබුණු බව ඌරුවල් පේරුව ඉඩම් සමීක්ෂණයේදී අනාවරණය විය.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත කරුණු නිරික්ෂනය කරනු ලැබේ.

<u>ප්‍රමාද වූ ව්‍යාපෘති</u>

(අ) බස්නාහිර පළාත් සංවර්ධන (විශේෂ) වැඩසටහන යටතේ වූ ගම නැගුම එක් ගමකට එක් වැඩක් ව්‍යාපෘතිය මගින් බුත්පිටිය පොදු ක්‍රීඩාපිටියක් ඉදිකිරීම වෙනුවෙන් රු.1,000,000 ක් වූ ඇස්තමේන්තුව 2012 ජූලි 09 වෙනි දින අනුමත වී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු මුදලින් 20% ක්වූ රු.195,904 ක අත්තිකාරම් මුදලක් 2012 සැප්තැම්බර් 13 දින මහර ප්‍රාදේශීය ලේකම් ගෙන් ලැබී තිබුණ ද විගණන දිනය වූ 2013 මැයි 02 දින වන විටත් ගිවිසුම් අත්සන් කර ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබූනෙන් ව්‍යාපෘතිය 2013 වර්ෂය සඳහා අවිච්ඡේද වී තිබුණි.

(ආ) බස්නාහිර පළාත් සංවර්ධන (විශේෂ) වැඩසටහන යටතේ බුත්පිටිය ප්‍රජා ශාලාවක් ඉදි කිරීම වෙනුවෙන් රු.490,000 ක් 2012 වර්ෂයේදී අනුමත වී තිබුණි. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ 2013 අප්‍රේල් 01 දිනැති ලිපිය මගින් මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂයට අවිච්ඡේද කර තිබුණි. ඒ අනුව 2013 අප්‍රේල් 30 දිනට පෙර සියළුම ගෙවීම් කටයුතු අවසන් කළයුතු වුවද විගණිත දිනය වූ 2013 මැයි 02 දින වන විටත් ව්‍යාපෘතියේ වැඩ ආරම්භකර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) ගබඩා පාලනය